**පරිච්ඡේදය 19**

## 1. සංචාරක කර්මාන්තය හා බැඳුණු බලපිටියේ සුන්දරත්වය

සංචාරක කර්මාන්තය පිළිබඳ සඳහන් වන සෑම විටකම බළපිටියට හිමි වන්නේ සුවිශේෂ වූ ස්ථානයකි. එහි පවත්නා වූ ආකර්ශනීයත්වය සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධියට හේතු පාදක වීම ඊට හේතුවයි. විශේෂයෙන් ම දර්ශනීය වෙරළ තීරයන්ගෙන් සමන්විත වීම, මාදූ ගඟ පරිසර පද්ධතිය, කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන මෙන් ම සංචාරක මණ්ඩලය මගින් නියම කරන ලද නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව ඉදි කර ඇති සංචාරක හොටෙල්, අවන්හල් මෙන් ම තරු පංතියට අයත් වන හෙරිටන්ස්, රියූ සහ ෂෙරිටන්ස් වැනි හෝටල් ද මේ සඳහා දායකත්වය ලබා දේ.

### 1.1. සංචාරකයින් සඳහා ඇති ආකර්ශනීය ස්ථාන

- **මාදූ ගඟ**
- **කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන**
- **බෝට් සර්විස්**
- **හොටෙල්/විලා/නිවාඩු නිකේතන/ගෙස්ට් හවුස් ආදිය**
- **පිහිනීමට හැකි පිහිනුම් තටාක ලෙස සකස් වූ මුහුදු තොටවල්**

  **ගල්බොක්ක වෙරළ තීරය**

  **බණ්ඩරවත්ත (හරස්පළ)**

  **අහුන්ගල්ල තොටුපල**

  **එගොඩමුල්ල වෙරළ තීරය**

  **වැල්ලබඩ වෙරළ තීරය**
- **පන්සල්/දේවාල ආදිය**

  **කොත්දූව පන්සල**

  **ශ්‍රී පුෂ්පාරාමය (නායක පන්සල)**

  **නුරුගල පන්සල**

  **මෝදර දේවාලය**

### 1.1.1. මාදු ගඟ

#### 1.1.1.1. මාදු ගඟේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ වැඩිම දූපත් සංඛ්‍යාවක් සහිත ගංභාව වන්නේ මාදු ගඟයි. සාමාන්‍යයෙන් ගංභාවක් මධ්‍යම කඳුකරයෙන් ආරම්භවී අනතුරුව රට පුරා ගලා ගොස් මුහුදට එක් වීම සිදු වන නමුත් මාදු ගඟේ ඇති විශේෂත්වය වන්නේ රටේ පහළ කොටසින් (පොල්අතුපළාත ග්‍රාම නිලධාරී වසමෙන්) ආරම්භවී කි.මී. 5-6ත් අතර දුරක් ගමන් කර අනතුරුව මුහුදට එකතු වීමයි.

දැනට ලැබී ඇති සාධක අනුව මාදු ගඟ හා බැඳුණු ඉතිහාස කතාව ඇරඹෙන්නේ දඹදෙණි යුගයෙනි. (ක්‍රි.ව.1236-1283). එම යුගයෙහි දෙවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය තුළ ඉතිහාසය පිරික්සීමේදී මාදු ගඟ වැලිගඟ යන නමින් හඳුන්වා ඇත. ඒ පිළිබඳ සාක්ෂි මහාවංසය, පූජාවලිය, සිදත් සඟරාව, රාජාවලිය වැනි ග්‍රන්ථ මෙන් ම මයූර, තිසර, පරෙවි, ගිරා, කොකැටු, නිල්ලිහිණි, ඔපිසර, මානව, කොණ්ඩකුරුලු හා ගුරුළු යන සංදේශ කාව්‍ය විමසීමේදී ද දැකගත හැකි ය. දෙවන පරාක්‍රමබාහු රජු රාජ්‍යත්වයට පත්ව එකොලොස් වැනි වර්ෂයේදී චන්ද්‍රභානු ප්‍රධාන ජාවක හමුදාවක් ලංකාව ආක්‍රමණය සඳහා පැමිණ තිබේ. මෙම සේනාවන් දකුණේ හැම ගං තොටකින් ම ගොඩ බැස රට තුළට ඇතුළු වූ බව සඳහන් වේ. එම සේනාවලින් කොටසක් දිවයිනට පැමිණ ඇත්තේ වර්තමාන බලපිටියේ ‘වැලිතොට මෝය’ අසලින් බවට පැහැදිලි සාධක ලැබී තිබේ. මෙම ජාවක හමුදාව දිවයිනෙන් බැහැර කිරීම සඳහා බුවනෙකබාහු සහ වීරබාහු යුවරජු මෙන් ම දේව පතිරාජ අමාත්‍යවරයා ද පෙරමුණගත් බවත් එම සටන වැලි නදිය හෙවත් මාදු ගඟ දෙපසෙහි සිදු වූ බවත් සඳහන් වේ. මාදු ගඟ සම්බන්ධ ඓතිහාසික පුවතට අවියෝජනීය ලෙස සම්බන්ධ වන්නේ මෙම දේවපතිරාජ අමාත්‍යවරයායි. මෙම අමාත්‍යවරයා හට දකුණු ලංකාවේ සංවර්ධන කාර්යයන් භාරවූ අතර, එතුමා විසින් ම ගොඩනංවනු ලැබූ “මාදෙල්ගස් ගමුව” පමුණු වශයෙන් එතුමාට හිමි විය.

“……එයින් ගොස්, මහදෙල්ගස් නම් වූ මහ වනය මුලිනුදුරා මහත්වූ ග්‍රාමයක් බිම් පිස උපදවා, ඒ වනය කොස් වනයක් කොට, එහි තුන් මහල් පිළිම ගෙයක් ආදී වූ ආරාමයක් කොට රජහු නමින් මහත් වූ දාන පූජාකොට නැවත රජහු කරා අවුත්, තමන් රජහු නමින් කළ කළ පින් දැක්වූහ. එකල රජ පා ඔහු කෙරෙහි උපන් මහත් වූ කරුණා ඇතිව, ඔහු කැරවූ මහදෙල් ගස් නම් වූ ග්‍රාමය ආදී වූ නොයෙක් හිමි පමුණු දී…” (පූජාවලිය, 769, 797 පිටු)

මෙම ප්‍රදේශය වර්තමානයේ පතිරාජ පෙදෙස ලෙස හැඳින්වේ. දේවපතිරාජ අමාත්‍යවරයා සම්බන්ධ ගම්, ආරාම, පාසල් ආදී ස්ථාන විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට ද බළපිටිය පුරවරය හා සම්බන්ධ වී තිබේ. මාදු ගඟ සම්බන්ධ ඉතිහාසය විමසීමේදී මෙලෙසින් පතිරාජ අමාත්‍යවරයා සම්බන්ධ කාලය පිළිබඳ තොරතුරු හමුවෙන අතර මයූර සංදේශයෙන් ආරම්භව විවිධ සංදේශ කෘති තුළ ද මාදු ගඟ සම්බන්ධ වර්ණනා රාශියක් දැක ගත හැකිය.

තොටගමු පාය රඳි මහතෙරිඳු ගුණ හිවී
සත සැප සේ ය යන ලෙසැ රැකැ තමන් දිවී
දළ සල මේය තර කර කැරැවූ බැහැවී
**වැලිතොට ඒ ය** සිරි දැක වඩනේ මැනවී (කොවුල් 85 කවිය)

"ඒය" යනු පාලමයි. මෙහි වැලිතොට ඒය යනුවෙන් හඳුන්වා ඇත්තේ මාදු ගඟ හරහා මාදූව දක්වා වැටී ඇති පාලමයි. ගම්පොළ යුගයේ දී තිබූ ලී පාලමක් ලෙසත් කෝට්ටේ යුගයේදී ගල් පාලමක් ලෙසත් සංදේශ කාව්‍ය තුළ මෙම පාලම දක්වා තිබේ. 1922 වන විට මෙය යකඩ පාලමක් ලෙස දක්වා තිබේ.

අරකට දෙතොට සවිකර ගල්බැමි බැඳ වා
දුරකොට ගඟෙහි සිටුවා යකණුත් සද වා
තරකොට එමතුපිට මග යකඳක් යොද වා
කර තුට බලව ගඟ සැදි පාලම සෙද වා (කොකැටු සංදේශය, 56 කවිය)

මෙම පාලමින් ගොඩබිම හා සම්බන්ධ වන මාදූව මාදු ගඟේ දූපත් අතරින් විශාල ම දූපත වන අතර එය මුල්කොටගෙන අතීතයේ වැලි නදිය ලෙස හැඳින්වූ ගඟ වර්තමානයේ මාදු ගඟ ලෙස නම් වන්නට ඇතැයි විශ්වාස කළ හැක. මහ+දූ+ගඟ > මාදූ + ගඟ = මාදු ගඟ වන්නට ඇතියි එහි නිරුක්තිය බලන විට පෙනී යයි.

උපසම්පදාව හා අමරපුර නිකායේ ආරම්භය සිදු වී ඇත්තේ ද මාදු ගඟ ආශ්‍රිතව ය. අමරපුර නිකායට අයත් "සෙජින්" නම් වූ උදකුක්ඛෙප මහා සීමා මාලකය පිහිටුවනු ලැබ ඇත්තේ මාදු ගඟ මුවදොර අසළ ය. 1878 ඔක්තෝම්බර් මාසයේ දී එම සීමාමාලකයෙහි උපසම්පදා කර්මය සිදු කොට ඇත.

ලක්දිවට දළදා වහන්සේ රැගෙන ආ හේමමාලා කුමරිය හා දන්ත කුමරු මහසෙන් රජ සමයේදී අනුරාධපුරයට නොගොස් දකුණු වෙරළේ වැලිනදී තොටමුණෙන් කොත්දූවට වැඩමවා සිට කිත්සිරි මෙවන් රජු සිහසුනට පත්වූ පසු නැවත ගිය බව ජනප්‍රවදයේ පවතින තවත් විශ්වාසයකි. කොත්දූවේ දළදාවහන්සේ වැඩසිටි නිසා එම කොත්දූවට පරිවාර වන පරිදි අවට ගම් බිම් වල විහාරස්ථාන 23 ක් පමණ මෙම තෙත්බිම් කලාපයේ අදට ද දැකගත හැකි ය.

1960 දශකයේ මුළු යුරෝපයේම තෙත් බිම් සීග්‍රයෙන් අඩුවීම හා ජලාශ්‍රිත පක්ෂීන් විශාල ලෙස වඳ වීම වැනි තර්ජන වලට මුහුණපා ඇත. එය මූලික කොට ගනිමින් තෙත්බිම් සම්බන්ධව අන්තර්ජාතික සමුළුවක් 1971 පෙබරවාරි මස 2 දින ජාතීන් 18කගේ සහභාගිත්වයෙන් ඉරානයේ රැම්සා නුවරදී පවත්වා ඇත. එහිදී ජගත් තෙත් බිම් සංරක්ෂණය කිරීම සඳහා අන්තර්ජාතික සම්මුතියක් අත්සන් තබන ලද අතර එය රැම්සා සම්මුතිය නමින් හැඳින්වේ.

ජගත් තෙත් බිම් සංරක්ෂණය සඳහා වූ සම්මුතියට ශ්‍රී ලංකා රජය ද එකඟ වී අත්සන් තබා තිබේ. ඒ අනුව රැම්සා සම්මුතියෙන් සංරක්ෂණය වන තෙත් බිම් කිහිපයක් මේ වන අප රටේ ඇත. ඒවා අතර බුන්දල ජාතික උද්‍යානය, කුමන ජාතික උද්‍යානය ආනවිලුන්දාව, වන්කාලේ සහ මාදූ ගඟ අභයභූමිය සුවිශේෂියි.

මාදූ ගඟ ආශ්‍රිත ප්‍රදේශයේ වටිනාකම හඳුනාගත් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් සංචාරක ප්‍රවර්ධන කලාපයක් ලෙස 2002 වර්ෂයේදී නම් කර ඇත. මාදූ ගඟෙහි ඇති අන්තර්ජාතික වටිනාකම හේතුවෙන් වර්ෂ 2013 දෙසැම්බර් මස 11 වන දින ගඟ ආශ්‍රිත පරිසර පද්ධතිය රැම්සා තෙත් බිමක් ලෙස රැම්සා ලේකම් කාර්යාලය විසින් නම් කර තිබේ. එය ශ්‍රී ලංකාවේ තෙවන රැම්සා තෙත්බිමයි. මෙය දිවයිනේ තෙත් කලාපය තුළ ප්‍රකාශයට පත් වූ ප්‍රථම රැම්සා තෙත් බිමයි. එමෙන්ම එය ලෝක රැම්සා තෙත්බිම් නාමාවලියේ 1372 වැනි තෙත්බිම වේ. මෙය සංචාරක කලාපයක් ලෙස ද 2006දී අභය භූමියක් ලෙස ද ප්‍රකාශයට පත් වී ඇති තෙත් බිමකි.

රැම්සා සම්මුතියට අනුව "බාදිය මට්ටමේ සිට මීටර් 6ට අඩු, මුහුදු පෙදෙස් ද ඇතුළත්ව, ගලා යන හෝ නිශ්චලව පවතින්නාවූ, මිරිදිය, කිවුල් දිය හෝ ලවන දියෙන් තාවකාලිකව හෝ ස්ථිරව යටවී ඇති කෘතිම හෝ ස්වභාවික වගුරුබිම්, විල්ලු, ජලාශ හෝ ජල මාර්ග හැල ඉඩම් පිටි ඉඩම් තෙත් බිම්" ලෙස සැළකේ. ඒ අනුව මාදූ ගඟ තෙත් බිමේ ස්වභාවය කරදිය සහ මිරිදිය මිශ්‍රවූ කිවුල් දිය සහිත, ගංමෝය, නිම්නය, දූපත් ආශ්‍රිත වගුරු බිම්වලින් ද යුත් කලපුවක් වන ස්වභාවික තෙත්බිමකි.

ඌරගහ ප්‍රදේශයේ පොල්අතුකන්ද ආශ්‍රිතව ජල දහරා හා වර්ෂා ජලය එකතු වීමෙන් මුලින්ම නිර්මාණය වන මාදූ ගඟ ටික දුරක් ගලා ඒමෙන් එකවරම විශාල ගංභාවක් බවට පත් වේ. දිගින් අඩු පළලින් වැඩි ජලාශයක් ආකාරයට මෙය නිර්මාණය වේ. වැදගත්ම ලක්ෂණය වන්නේ මේ හා බැඳි කඩොලාන පරිසරය හා විශාල දූපත් ප්‍රමාණයයි.

### 1.1.1.2. මාදූ ගඟේ භූගෝලීය පිහිටීම

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බටහිර වෙරළට ආසන්නව වෙරළබඩ තැනිතලාවේ නැගෙනහිර දේශාංශ 80.1 හා 85.5 අතර ද, උතුරු අක්ෂාංශ 6.4 හා 6.22 අතර පිහිටා ඇත.

මාදූ ගඟ තෙත්බිම අයත් වන්නේ නිරිතදිග වෙරළබඩ පහත්බිම් කලාපයට නොහොත් පහතරට තෙත් කලාපයට ය. එය වෙරළ ඉමත්, මීටර් 30 සමෝච්ච් රේඛාවත් අතර පිහිටා ඇත. මාදූ ගඟ බළපිටිය ප්‍රධාන පාලම අසළ වූ බලපිටි මෝයෙන් මුහුදට යාවේ.

ජනප්‍රවාදවලට අනුව මෙහි දූපත් 64ක් තිබූ බව සඳහන් වුව ද වර්තමානයේ දී පවතින්නේ දූපත් 15ක් පමණි. මාදූ ගඟ හෙක්ටයාර 915ක් පුරා පැතිරී පවතින අතර ඉන් 770ක් ජලයෙන් වැසුණු තෙත් බිම් අතර 145ක් ගොඩබිම් වේ.

පරිපාලන බෙදීම අනුව බළපිටිය හා කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර පිහිටා ඇත. බළපිටිය ප්රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්රාම නිලධාරී වසම් 26කින් හා කරන්දෙණිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 07කින් මාදූ ගඟ තෙත්බිම පරිපාලනමය වශයෙන් වටවී තිබේ.

### 1.1.1.3. මාදූ ගඟ පෝෂණය වන ඇළ මාර්ග

ප්‍රධාන පෝෂකය වන මාගල ඇළට අතිරේකව පහත සඳහන් ඇළ මාර්ගවලින් මාදූ ගඟ තෙත් බිම පෝෂණය වේ.

- ලේනගල ඇළ
- පරවතුර ඇළ
- හොරඹු ඇළ
- නෙල්ලිගොඩ ඇළ
- වෙලන්ගොඩ ඇලෙන් සහ කරිජ්ජපිටිය ඇලෙන් පෝෂිත මුදලි ඇළ
- සීනිගොඩ ඇළ
- ඇරවටිල ඇළ
- පුංචි පනාපිටිය ඇළ
- ගලගාවෙල - මහවෙල ඇළ
- දම්මලාව හීන් ඇළ

### 1.1.1.4. මාදූ ගඟ පරිසර පද්ධතියෙහි ජෛව විවිධත්වය

නිරන්තරයෙන්ම ස්වභාවිකව නිර්මාණය වන වෙරළබඩ වැලි වැටි (වැලි පවුරු) නිසා අතීතයේදී මාදූ ගඟ වැලිනි (සිදත් සඟරාව), වාලුකා තීර්ථ, වාලුකා නදී, වැලි නදී හෝ වැලි ගඟ යනුවෙන් හඳුන්වා ඇති බව පෙනේ. මෙම වැලි වැටි නිසා මෝය කට නිතර නිතර අවහිර වීම මෙහි දක්නට ලැබෙන ස්වභාවික විශේෂත්වයකි. ජලයේ සහ මසුන්ගේ ද, මුහුදේ සහ කලපුවේ ද එහා මෙහා යාමේ ගමන මෙම වැලි වැටියෙන් වැලකීම හේතුවෙන් ධීවරයින් හට සිය යාත්‍රා මුහුදට ගෙන යාමත්, මුහුදෙන් ගෙන ඒමත් මේ නිසා අසීරු වේ. එහෙත් වැලි වැටියෙන් කලපුවේ පරිසර පද්ධතිය හා ජෛව විවිධත්වය පාලනය වේ.

මාදූ ගඟ ආශ්‍රිතව පවත්නා ජෛව විවිධත්වය ද සුවිශේෂී ය. මෙහි පරිසර පද්ධතිය තුළ ශාක කුල 95කට අයත් වන ශාක විශේෂ 302ක් පමණ වාර්තාවී තිබෙන අතර මින් ශාක විශේෂ 19ක් ශ්‍රී ලංකාවට ම ආවේනික වේ. ඒ අතර ශාක විශේෂ 8ක් ජාතික වශයෙන් වඳ වීමේ තර්ජනයට මුහුණ පා ඇති බව වාර්තා වේ. කඩොලාන ආශ්‍රිතව හඳුනාගත් ශාක විශේෂ 14ක් වන අතර දේශීය පෘෂ්ඨ වංශික සතුන් 20%ක් ද, පක්ෂීන් විශේෂ 111ක් ද වන අතර මේ පරිසරය ආශ්‍රිතව ඉන් 43%ක් හමු වී ඇත. එමෙන්ම මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය විශේෂ 70ක් පමණ ද කිඹුල් විශේෂ දෙකක් ද, කටුසු විශේෂයක් ද, ඉන්දියානු පිඹුරා ද මෙහිදී වාර්තා වී තිබේ. රුක්වාසී ක්ෂීරපායී විශේෂ තුනක් ද හමුවේ. දම් වඳුරා, උරුලෑවා සහ උනහපුළුවා ඒ අතර වේ.

සාගර දූෂණය වෙරළ ඛාදනය ආදී ව්‍යසනයන් වැලැක්වීම හා මත්ස්‍ය සම්පත බෝවන තිඹිරි ගෙය ලෙස කඩොලාන ශාකය හැඳින්විය හැක. මල් කඩොල්, සිරිබණ්ඩ සහ කිරල මණ්ඩ, කටු ඉඹුල්, මුට්ට කඩොල්, ගිං පොල් හා කැරන් කොකු ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන කඩොලාන ශාක වන අතර මාදු ගඟ ආශ්‍රිතව පමණක් කඩොලාන වර්ග 14ක් පමණ හමු වේ. දැනට ශ්‍රී ලංකාවේ කඩොලාන විශේෂ 30ක් පමණ වාර්තා වන අතර ඉන් විශේෂ 5ක් ම වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇත. ඒ අතර “රත්මිල්ල” (Lumnitzera littorea)එක් විශේෂ වූ වර්ගයකි. මෙම ශාකය මාදු ගඟ ආශ්‍රිත පරිසරයේ පමණක් දැනට හමු වේ.



ඡායාරූපය 19.1. රත්මිල්ල ශාකය

මාදුව ආශ්‍රිත ප්‍රදේශයේ ඇති ශාක ප්‍රජාව අතර නා, බෝවිටියා, වල්දෙල්, ඉඳි, කුරුඳු වැනි ශාක ද ඕලු, නෙලුම්, කෙකටිය වැනි ජලජ පැළෑටි ද දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ සමනල කුල 9ක් දක්නට ලැබෙන අතර මාදු ගඟ ආශ්‍රිතව එම සමනල කුල 9ම දක්නට ලැබීම විශේෂත්වයකි.

### 1.1.1.5. මාදු ගඟ තෙත් බිමේ වැදගත්කම

මාදු ගඟ තෙත් බිම එහි අවට වෙසෙන ජනයා හට නිෂ්පාදන හා සේවා රැසක් ඉටු කරන ස්වභාවික සම්පතකි. තවදුරටත්,

- කඩොලාන පද්ධතිය රැක ගැනීම
- පරිසරයේ අසිරිය රැක දීම
- ජලය, ආහාර, ඖෂධ, ඉන්ධන සැපයීම
- ජෛව විවිධත්වය රැක ගැනීම
- පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම
- පක්ෂීන්ට හා ජලජ ජීවීන්ට ආරක්ෂාව හා වාසස්ථාන සැපයීම
- ඉවුරු ඛාදනය වැලැක්වීම
- රැකියා අවස්ථා සැපයීම (මාදු ගඟ ආශ්‍රිතව බැඳුනු කර්මාන්ත ලෙස මිරිදිය ධීවර කර්මාන්තය, කොහු කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන හා සංචාරක කර්මාන්තය ද දක්නට ලැබේ)

- විනෝදාස්වාදය සැපයීම
- සංචාරක ආකර්ශනය ලබා ගැනීම තුළින් විදේශ විනිමය උපයා දීම. (මාදු ගඟ පරිසරය සංචාරක ආකර්ෂනීය පාරාදීසයක් බවට පත්ව ඇති බැවින් ඒ ආශ්‍රිතව ගොඩ නැගුණු සංචාරක නිකේතන කිහිපයක් ද හඳුනා ගත හැකි ය. මාදු ගඟ ආශ්‍රිතව සිදු කරන කර්මාන්තයක් ලෙස සංචාරක බෝට්ටු කර්මාන්තය දැකිය හැකි අතර ඉන් විශාල ආදායමක් ලංකාවට හිමි කර දේ)
- කලාත්මක නිර්මාණ සඳහා අමුද්‍රව්‍ය සැපයීම (රූකඩ නිර්මාණයට යොදා ගන්නා ගොන් කදුරු, කදුරු වැනි දැව, පැදුරු, මලු, පෙට්ටි ආදිය වියීමට යොදා ගන්නා පන් වර්ග ආදිය)
- ගංවතුර පාලනය කිරීම
- භූගත ජලය සුරැකීම ආදී සේවා රැසක් සපයන මාදු ගඟ අවට ජීවත් වන ජනයා හට මෙන් ම විදේශිකයන් හට පවා ඉමහත් සම්පතක් ලෙස සැලකිය හැකි ය.

### 1.1.1.6. මාදු ගඟ තෙත් බිම් පරිසරයට බලපා ඇති තර්ජන

මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ලබන්නේ මිනිස් ක්‍රියාකාරකම් ය. සංචාරක කර්මාන්තය වෙනුවෙන් මාදු ගඟ අවට සංචාරක බෝට්ටු සේවා ආයතන රාශියක් ක්‍රියාත්මක වේ. මෙම බෝට්ටු ධාවනයේදී යොදා ගන්නා ඉන්ධන ගඟේ ජලයට එක් වීම හේතුවෙන් මත්ස්‍ය ජනගහනය අවම වීම, ජලය දූෂණය වීම මෙන් ම බෝට්ටු මගින් නිපදවන ප්‍රබල දිය රැළි හේතුවෙන් ඉවුරු ඛාදනය ද සිදු වේ. අනවසර ගොඩ කිරීම් හා ඉදි කිරීම් මගින් මාදු ගංගා නිම්නය විනාශ වෙමින් පවතන අතර කඩොලාන සම්පතට ද දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතී.

වැටවල් ගැසීමට, ඉස්සන් කොටු සෑදීමට, කුඩා නිවාස තැනීමට අධික ලෙස කඩොලාන ශාක විනාශ කිරීම දකින්නට ලැබෙන ප්‍රමුඛ පෙළේ තර්ජනයන් ය. සංචාරක කර්මාන්තය උදෙසා සාමාන්‍ය ඉදිකිරීම් නීතිය උල්ලංඝණය කරමින් පරිසර විවිධත්වයට උග්‍ර ලෙස හානි කිරීම් කර තිබේ. සංචාරක කර්මාන්තය හා පැනනැගුනු තවත් ගැටළුවක් වන්නේ ඒ ආශ්‍රිත අපද්‍රව්‍ය තෙත්බිමට හා ජලාශයට එක් කිරීමයි. මාදු ගඟ ආශ්‍රිතව තවමත් එය විශාල ගැටළුවක් වී නොමැති අතර අනාගතයට එය එසේම පාලනය කිරීම ඒ ඒ අංශයන් සතු වගකීමක් වන්නේ ය. එමෙන්ම නිසි ප්‍රමිතියකින් හා සැලැස්මකින් තොරව ව්‍යාපෘති හා හෝටල් ඉදි කිරීමෙන් හා ඇළ මාර්ග අවහිර කිරීම හේතුවෙන් මාදු ගඟ පරිසර පද්ධතියේ සුන්දරත්වයට හානි සිදු වෙමින් පවතී.

කුරුඳු වගාව සඳහා නීති විරෝධීව තෙත් බිම හෙළි පෙහෙළි කිරීම ද වත්මන වනවිට විශාල ලෙස උද්ගත වී තිබෙන ප්‍රශ්නයකි. කුරුඳු වගාව විශාල ආර්ථික උත්පාදන ක්‍රියාවලියක් බැවින් මිනිසුන් ඒ සඳහා යොමු වී සිටී. කුරුඳු වගාව හේතුවෙන් පැන නගින විශාල ගැටළු අතරින් කඩොලාන කැපීම, පස සෝදා රොන් මඩ ගඟට එක් වීම, ජල පෝෂක ප්‍රදේශ අඩු වීම ආදිය විශේෂ වේ.

මාදු ගඟ රැම්සා තෙත් බිමක් මෙන් ම දුර්ලභ හා අද්විතීය මට්ටමේ පරිසර පද්ධතියකි. එය සත්ත්ව හා ශාක ජීවී විශේෂයන්ට පමණක් නොව පාරිසරික මානව ප්‍රජාවගේ පැවැත්මට ද බෙහෙවින් උපකාරී

වේ. වඳවී යාමේ තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන්ට තෙත් බිම ආරක්ෂක ස්ථානයකි. එවන් වටිනාකමකින් යුතු මෙම පරිසර පද්ධතිය රැක ගැනීම සියලු දෙනා සතු වගකීමකි.

මෙවැනි ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගැනීමට අදාළ වගකීම් සහිත පාර්ශවයන් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමෙන්, සුන්දර බිම්කඩ අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කළ යුතු වන අතරම නූපන් පරපුරටත් මෙලෙසම සුන්දරත්වය විඳ සිත්සතන් සනසා ගැනීමට ඉඩ හසර විවර කරදීමට කටයුතු කළ යුතු වෙනවා නේද?

### 1.1.1.7. මාදු ගඟේ අසිරිය



ඡායාරූප 19.2. සුන්දර මාදු ගඟ පරිසරය

### 1.1.2. කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන

ලෝකයේ කැස්බෑවුන් විශේෂ හතක් ජීවත් වේ. උරගයින් (Reptiles) වන මොවුන් පරිණාමය වශයෙන් වසර මිලියන 150ක් පමණ වෙතැයි ගණන් බලා ඇත. ඒ අනුව කැස්බෑවුන් මේ මිහිතලයේ ජීවත් වන ඉපැරණිම ජීවී විශේෂයක් ලෙස සැලකිය හැකි ය. ලොව වෙසෙන කැස්බෑ විශේෂ හතෙන් පහක් ම ශ්‍රී ලංකාවේ වෙරළ කිහිපයකදී ම නිරීක්ෂණය කිරීමේ හැකියාව ඇත. නිවර්තන කලාපීය දූපතක් වශයෙන් මෙම ජීවී විශේෂවල පැවැත්ම තහවුරු කිරීම සඳහා අප අවට සාගර කලාපය මෙන් ම වෙරළ කලාපය ද අතිශය වැදගත් වේ.

ලංකාවේ දැකගත හැකි කැස්බෑවුන් විශේෂ පහ පහත පරිදි වේ.

- කොළ කැස්බෑවා නොහොත් ගල් කැස්බෑවා (Green Turtle - විද්‍යාත්මක නාමය: Chelonia mydas)
- බටු කැස්බෑවා (Olive Ridley Turtle - විද්‍යාත්මක නාමය: Lepidochelys olivacea)
- පොතු කැස්බෑවා (Hawksbill Turtle - විද්‍යාත්මක නාමය: Eretmochelys imbricate)
- ඔළුගෙඩි කැස්බෑවා (Loggerhead Turtle - විද්‍යාත්මක නාමය: Caretta caretta)
- දාර කැස්බෑවා (Leatherback Turtle - විද්‍යාත්මක නාමය: Dermochelys coriacea)

ලංකාවේ දැකිය නොහැකි විශේෂ දෙක ලෙස ෆ්ලැට් බැක් කැස්බෑවා (Natator depressus) සහ කෙම්ප්ගේ රිඩ්ලි කැස්බෑවා (Lepidochelys kempil) දැක්විය හැක.

අද වන විට තර්ජනයට ලක් වී ඇති උභය ජීවියෙකු ලෙස කැස්බෑවා හැඳින්වේ. ලෝකයේ කැස්බෑ විශේෂ 7ක් පමණ ඇති අතර බළපිටිය කලාපය තුළ පමණක් කැස්බෑ විශේෂ 5ක් දක්නට ලැබීම ඉතාමත් වැදගත් වේ. බළපිටිය කොට්ඨාසයට සම්පතක්ව ඇති මෙම කැස්බෑවුන් බහුල ලෙස ම කොස්ගොඩ, අහුන්ගල්ල ආදී වෙරළ කලාප තුළ දක්නට ලැබේ. එබැවින් කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන මෙම වෙරළ කලාප මූලික කරගෙන ක්‍රියාත්මක වේ. සංචාරක කර්මාන්තයට මෙම කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන ලබා දෙන්නේ සුවිශාල වූ දායකත්වයකි.

#### 1.1.2.1. කැස්බෑ විශේෂ

##### 1.1.2.1.1.කොළ කැස්බෑවා නොහොත් ගල් කැස්බෑවා (Green Turtle)

තරමක් විශාල ප්‍රමාණයකට වැඩෙන ගල් කැස්බෑවන්ගේ කටුව ඔලිව් හෝ අඳුරු කොළ/දුඹුරු මිශ්‍ර පැහැයක් ගනී. උඩින් බැලූ විට හදවතක හැඩරුවට සමාන වේ. මෙම කැස්බෑවන් ශ්‍රී ලංකාවේ අකුරැල්ල, මාවැල්ල, කොස්ගොඩ, රැකව, අම්බලන්තොට, යාල සහ බුන්දල යන ප්‍රදේශවල වෙරළ තීරය

ඡායාරූප 19.3. ලොව වෙසෙන කැස්බෑ විශේෂ ට ඡායාරූප 19.4. ලංකාවේ වෙසෙන කැස්බෑ විශේෂ

බිත්තර දැමීම සඳහා පැමිණේ. ඔවුන් නිවර්තන සහ

උපනිවර්තන කලාපවල, විශේෂයෙන් සාගර දූපත් වටා සහ පුළුල් වැලි සහිත වෙරළ තීරයන් සහිත වෙරළ තීරයේ බහුලව ව්‍යාප්ත වී ඇත. එසේම ඔවුන් ප්‍රධාන වශයෙන් සෞම්‍ය ජලය සහිත සියලුම සාගරවල දක්නට ලැබේ. අත්ලාන්තික් සහ නැගෙනහිර පැසිෆික් සාගරවල විශාල ජනගහනයක් ඇත.

සංසර්ග කාලයන් වෙනස් වන නමුත් වසර පුරා සිදු වේ. තනි තනි ගැහැණු කොළ කැස්බෑවන් සාමාන්‍යයෙන් සෑම වසර 2-4 කට වරක් සංසර්ගයේ යෙදේ. නමුත් ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළ වැඩිවීමක් දක්නට ලැබේ. වසර පුරා ම බිත්තර දමයි. වරකට බිත්තර 100-175ක් පමණ දමයි. නිවර්තන කලාපීය මුහුදුවල වැඩි ලෙස සැරිසරයි.

ජලයේ සංසර්ගයෙන් පසු ගැහැණු සතුන් ඉහළ වඩදිය රේඛාවට ඉහළින් වෙරළට ඇද දමයි. සුදුසු කැදලි ස්ථානයකට ළඟා වූ පසු ගැබිනි ගැහැණු සතා ඇගේ පසුපස වරල්වලින් සිදුරක් හාරා කූඩුවේ බිත්තර ගණනාවක් තැන්පත් කරන අතර පැටව් ගණන ගැහැණු සතාගේ වයස මත රඳා පවතී. බිත්තර දැමීමෙන් පසු ගැහැණු සතා වැලි වලින් කූඩුව ආවරණය කර මුහුදට නැවත පැමිණේ.

බිත්තර මෘදු කවච සහිත සහ ගෝලාකාර වේ. සෑම කූඩුවකම බිත්තර 98-172 ක් අඩංගු වේ. පැටවුන් බිහි වීම මාස 2 කට පසු සිදු වේ. කැදලි කාලයකදී එක් ගැහැණු සතෙකුට කූඩු 11 ක් දක්වා තැබිය හැකිය. බිත්තර පුපුරා රාත්‍රියේදී පැටවුන් බිහි වන අතර අලුතින් මතු වූ කැස්බෑවන් සහජයෙන්ම ජල අද්දර දෙසට ගමන් කරයි. පැටවුන් බිහි වූ පසු පළමු වසර පහ තුළ ඔවුන්ගේ මුල් ජීවිතයේ අවධීන්ගෙන් වැඩි ප්‍රමාණයක් විවෘත සාගරය තුළ අභිසාරී කලාපවල ගත කරනු ලබයි.

මිනිස් ක්‍රියාකාරකම් කිහිපයක් නිසා මෙම කැස්බෑවන්ගේ ගහනය අනතුරට මුහුණ පා ඇත. ඔවුන් මස් සඳහා දඩයම් කරනු ලබන අතර ධීවරයින්ගේ දැල්වලට හසු වී දියේ ගිලීමෙන් ද බොහෝ කැස්බෑවුන් මිය යයි. ඔවුන්ගේ බිත්තර කූඩු වලින් එකතු කර ප්‍රණීත ආහාරයක් ලෙස අනුභව කරනු ලැබේ. එසේම මානව සංවර්ධනය හේතුවෙන් වාසස්ථාන අහිමි වීම කොළ කැස්බෑ කූඩු වෙරළ තීරයන් අහිමි වීමට බලපෑ ප්‍රධාන හේතුවකි.

කැස්බෑවෙකුගේ ජීවිතයේ භයානකම කාලය වන්නේ පැටවුන් ජලයට යාමයි. කකුළුවන් වැනි විවිධ විලෝපිකයන් බොහෝ පැටවුන් ආහාරයට ගනී. ඔවුන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් කිසි විටෙකත් සාගරයට නොයා අතරමගදීම ජීවිතයෙන් සමු ගනී.

### 1.1.2.1.2.පොතු කැස්බෑවා (Hawksbill Turtle)

සාමාන්‍යයෙන් කුඩා විශේෂයක් වන මොවුන් දිගින් සෙන්ටි මීටර් 90 වන අතර වැඩුණු සතෙකු කි.ග්‍රෑ.50ක් පමණ බර වේ. නිවර්තන නොගැඹුරු සාගරවල කොරල් පර ආශ්‍රිතව හමුවන මොවුන් ප්‍රධාන වශයෙන් මාංශ භක්ෂකය. විවිධ සත්ත්ව ප්‍රභේද ආහාරයට ගන්නා අතර ලොඩියන් (ජෙලි මසුන්) ස්පොන්ජියන්, ඉස්සන්, කකුළුවන් වැනි කොරල් පර ජීවීන් ඒ අතර ප්‍රධාන ය. කුඩා හිඩැස් හෝ පැලුම් අතර සිටින සතුන් අල්ලා ගැනීමට යෝග්‍ය වන ලෙස පිහිටා ඇති උකුස්සකුගේ වැනි හොටය නිසා හොක්ස් බිල් යන නම ලැබී ඇත. මොවුන්ගේ දර්ශනීය ශල්ක නිසා පොතු කැස්බෑවා

නමින් හඳුන්වන අතර එම ශල්ක ලබා ගැනීම සඳහා ලොව පුරා මෙම සතුන් ශත වර්ෂ ගණනාවක් තිස්සේ මරා දමනු ලැබේ. එම නිසා මොවුන් උග්‍ර ලෙස වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා සිටී.

මෙම කැස්බෑවුන් කැදලි තැනීම සඳහා ශ්‍රී ලංකාවේ කටඩුව, බෙන්තොට, උඩප්පුව, කොස්ගොඩ, කරඩුව, තලෙයිමන්නාරම, යාපනය, ගල්කිස්ස, තලවිල, පලටුපාන යන ප්‍රදේශවල වෙරළ තීරයන් වෙත පැමිණේ. මෙම කැස්බෑවන් ප්‍රධාන වශයෙන් අත්ලාන්තික්, පැසිෆික්, ඉන්දියන් සාගර සහ මධ්‍යධරණී මුහුදේ නිවර්තන කලාපවල දක්නට ලැබේ. ඔවුන් බොහෝ විට නිවර්තන ජලය සමඟ සම්බන්ධ වේ.

ගැහැණු සතෙකුගේ ප්‍රජනක පරිණතභාවය වසර 3 කින් සිදු වේ. සංසර්ගය දළ වශයෙන් සෑම වසර 2 සිට 3 දක්වා කාලයකට වරක් සිදු වේ. සංසර්ගය සාමාන්‍යයෙන් වෙරළට ආසන්න නොගැඹුරු ජලයේ ආරම්භ වේ. පිරිමි සතුන් නොගැඹුරු ජලයේ වැතිරී ගැහැණු සතුන් නැවත පැමිණෙන තෙක් බලා සිටිති.

සාමාන්‍යයෙන් කැදලි තැනීම සිදුවන්නේ අප්‍රේල්-ජූනි සහ දෙසැම්බර්-ජනවාරි අතර ය. සම්පූර්ණ කැදලි තැනීමේ ක්‍රියාවලියට ආසන්න වශයෙන් පැය එකක් හෝ තුනක් ගතවේ. සංසර්ගයෙන් පසු බිත්තර දැමීම සඳහා ගැහැණු සතුන් රාත්‍රියේදී වෙරළට පැමිණේ. ඔවුන්ගේ ගර්භණී කාලය සාමාන්‍යයෙන් දින 60 ක් පමණ වේ.

ගැහැණු සතුන් වසරකට දළ වශයෙන් දින 13-15 ක පරතරයකින් වාර 3 ක් පමණ බිත්තර දමයි. බිත්තර මි.මී.30-35ක් වැනි ප්‍රමාණයකින් යුක්ත වේ. මොවුන්ගේ ලිංගිකත්වය තීරණය කිරීම උෂ්ණත්වය මත රඳා පවතින බව සැලකේ. සාමාන්‍යයෙන් ග්‍රෑම් 24කට වඩා අඩු බරකින් යුත් කැස්බෑ පැටවුන් මාස 2 කට පමණ පසු රාත්‍රියේදී බිහි වේ. කිසිදු දෙමාපිය සහභාගීත්වයකින් තොරව පැටවුන් 96-177 ක් පමණ බිහි වන අතර ජලය මත සඳෙහි පරාවර්තනය මගින් ආකර්ෂණය වී ඔවුන් සහජයෙන්ම මුහුද දෙසට ගමන් කරයි.

වසර ගණනාවක් තිස්සේ මිනිසුන් විවිධ විසිතුරු භාණ්ඩ නිපදවීම සඳහා පොතු ලබා ගැනීමට මෙම කැස්බෑවන් දඩයම් කර ඇත. එසේම මිනිසුන් කැස්බෑවන් මෙන්ම ඔවුන්ගේ බිත්තර ද අනුභව කිරීමත් මොවුන් වඳ වී යන සත්ත්ව කොට්ඨාසයක් බවට පත් වීමට හේතු වී තිබේ. මොවුන්ගේ බිත්තර කුහුඹුවන්, මීයන්, කිඹුලන්, කකුළුවන්, බල්ලන් වැනි වෙනත් විලෝපිකයන්ගේ ආහාරය වේ.

### 1.1.2.1.3.ඔළුගෙඩි කැස්බෑවා (Loggerhead Turtle)

අන් කැස්බෑවන්ට වඩා විශාල හිසක් ඇති නිසා මොවුන් මේ නමින් හැඳින්වේ. මී.1.2ක් පමණ දිගින් වැඩෙන මොවුන් හඳුනා ගත හැක්කේ ඔවුන්ගේ රතු දුඹුරු වර්ණය සහ විශාල හිස නිසායි. ක්‍රස්ටේශියාවන් හා මොලුස්කාවන් ආහාරයට ගනී. ඉතා දුර්ලභ මොවුන් ලංකාවේ දකුණු හා

ගිණිකොණ වෙරළාශ්‍රිතව සැප්තැම්බර් හා මාර්තු මාසවල දැකිය හැක. වරකට බිත්තර 175ක් පමණ දමයි.

ගැහැණු සතුන් ඊස්ට්‍රජන් සහ ටෙස්ටොස්ටෙරෝන් කුඩා ප්‍රමාණයක් නිපදවයි. නමුත් බාහිරව විශාල වේ. පරිණතභාවයේ වයස වෙනස් වේ. පරිණත ප්‍රමාණය වයස අවුරුදු 10 ත් 30 ත් අතර වේ. ඇතැමුන් අවුරුදු 16 ත් 17 ත් අතර කාලයේදී පරිණත වන බවට පුරෝකථනය කර ඇත. පරිණතභාවයට පත්වීමෙන් පසු ප්‍රජනක ආයු කාලය අවුරුදු 32 ක් පමණ ලෙස ගණන් බලා ඇත. මොවුන්ගේ අභිජනනය ඇතැම් විට අවුරුදු 9ක් දක්වා වසර පුරා සිදුවිය හැකි නමුත් එය මැයි සහ ජූලි අතර උපරිමයට පැමිණේ.

කැදලි තැනීමේ කාලයට ටික කලකට පෙර පිරිමි ඔළුගෙඩි කැස්බෑවන් බොහෝ දුරට කැදලි තැබීමේ වෙරළ තීරයේ සිට වෙරළට ඔබ්බෙන් පිහිටි සංසර්ග භූමියට සංක්‍රමණය වේ. ගැහැණු සතුන් පෙම් සබඳතා සහ සංසර්ගය ආරම්භ කරන තෙක් ඔවුන් බලා සිටිති. පිරිමි සතෙකු ගැහැණු සතෙකු වටා රවුම්ව පිහිනා පසුව ඇය වෙත ළඟා වී ඇගේ බෙල්ල හෝ උරහිස සපා කනු ලබයි. ඉන්පසු ඔහු ඇය සමඟ සංසර්ගයේ යෙදීමට උත්සාහ කරන අතර ඇය ඔහුව පිළිගන්නේ නම් ඔවුන් සංසර්ගයේ යෙදෙනු ඇත. ගැහැණු සතෙකු පිරිමි සතා පිළි නොගන්නේ නම් ඇය ඇගේ ඔළුව ආවරණය කර පහළට පිහිනයි. නමුත් නොනවතින පිරිමි සතාට වාතය අවශ්‍ය වන තෙක් බලා සිට තවත් උත්සාහයක් ගත හැකිය. පිරිමි සතා තම ඉදිරි පාදවල දිගු වක්‍ර නියපොතු භාවිතා කරමින් සංසර්ගය පැය ගණනක් පැවතිය හැකි අතර අනෙකුත් පිරිමි සතෙකු බොහෝ විට සංසර්ගයේ යෙදෙන පිරිමි සතාට පහර දී ඔහුව පලවා හැරීමට උත්සාහ කරයි. පිරිමි සතෙකු ඉවත් කළහොත් තවත් සතෙකු ඉක්මනින් ඔහු වෙනුවට ආදේශ කළ හැක.

කැදලි කාලය තුළ ගැහැණු සතෙකුට ග්‍රහණයන් කිහිපයක් තැබිය හැකි අතර එක් එක් අවස්ථාවේදී නැවත සංසර්ගයේ යෙදිය හැකිය. සමහර අවස්ථාවලදී ඇය ග්‍රහණයන් අතර කිහිප වතාවක් සංසර්ගයේ යෙදිය හැකි අතර එබැවින් එක් කැදැල්ලකට පිරිමින් කිහිප දෙනෙකුගෙන් ශුක්‍රාණු දායක විය හැකිය. අනෙකුත් බොහෝ මුහුදු කැස්බෑවන් මෙන් නොව මෙම කැස්බෑවන් පෙම් සබඳතා සහ සංසර්ගය සාමාන්‍යයෙන් කැදලි වෙරළ අසල සිදු නොවේ. නමුත් ආහාර සහ අභිජනන ස්ථාන අතර සංක්‍රමණ මාර්ග ඔස්සේ සිදු වේ.

කැදලි කාලයන් අතර සාමාන්‍ය පරතරය අවුරුදු දෙකේ සිට තුන දක්වා වේ. ගැහැණු සතෙකුගේ ගර්භණී කාලය දින 46 සිට 80 දක්වා වේ. ගැහැණු සතුන් බිත්තර දැමූ වෙරළේ ම හෝ ඒ අසල බිත්තර දැමීමට නැවත පැමිණේ. බිත්තරයක ප්‍රමාණය මි.මී.34.7-55 වේ. බිත්තරය තුළ කළල වර්ධනයේ වේගය කූඩුව තුළ උෂ්ණත්වය මත රඳා පවතී. මෙම උෂ්ණත්වයට හිරු එළිය, සෙවන, වර්ෂාව, කූඩුව තුළ ජනනය වන තාපය සහ කූඩුව තුළ බිත්තරයක පිහිටීම බලපායි. සිසිල් උෂ්ණත්වයකදී එනම් 25ºC පමණ වන විට වර්ධනයේ සිට පැටවුන් බිහි වීමට දින 65 සිට 70 දක්වා

ගත විය හැකි නමුත් උණුසුම් උෂ්ණත්වයකදී 35ºC පමණ වන විට වර්ධනයට සාමාන්‍යයෙන් දින 45 ක් පමණ ගත වේ.

වැඩිහිටි කැස්බෑවුන්ට ඇති ප්‍රධාන තර්ජනය ඉස්සන් ට්‍රෝලර් යාත්‍රා සහ කකුළුවන් ඇල්ලීමේ දැල් වන අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් වාර්ෂිකව ඒවාට ගොදුරු වෙති. තවද වැඩිහිටි කැස්බෑවුන් බොහෝ විට වේග බෝට්ටු ප්‍රචාලක මගින් සහ ධීවර කොකු ගිලීමෙන් තුවාල ලබයි. ඔවුන් මස් සඳහා දැඩි ලෙස දඩයම් කරනු ලැබේ. එසේම බිත්තර මිනිසුන් විසින් අනුභව කරනු ලැබේ. මේදය රූපලාවන්‍ය ද්‍රව්‍ය සහ ඖෂධ සඳහා භාවිතා වේ. ඔවුන්ගේ කටු සඳහා ද ඔවුන් මරා දමනු ලැබේ. ඔවුන්ගේ ජනගහනය පහත වැටීමට තවත් වැදගත් හේතු අතර වෙරළබඩ සංවර්ධනය, කැදලි තනනා ගැහැණු සතුන්ට මිනිසුන් බාධා කිරීම, පළිබෝධනාශක, තෙල් කාන්දුවීම් සහ අනෙකුත් සාගර දූෂණ ආදිය ඇතුළත් වේ. මොවුන්ගේ බිත්තර ද කුහුඹුවන්, මීයන්, කිඹුලන්, කකුළුවන්, බල්ලන් වැනි වෙනත් විලෝපිකයන්ගේ ආහාරය වේ.

### 1.1.2.1.4.බටු කැස්බෑවා (Olive Ridley Turtle)

ලංකාවේ වෙරළ තීරයේ සැරිසරන කැස්බෑවන් අතරින් බරින් හා ප්‍රමාණයෙන් කුඩාම මොවුන්ගේ පිටත කටුව ලා කොළ/අලු පැහැයක් ගනී. දිගින් මී.80ක් පමණ වැඩේ. ඔවුන්ටම ආවේනික වූ වකුටු වූ උඩු ඇන්ද නිසා හඳුනා ගැනීමට පහසු වේ. ලංකාවේ වැල්ල ආශ්‍රිත ප්‍රදේශවල කැදලි තැනීමට පැමිණෙන මොවුන් සිය ගණනක් හෝ විටෙක දහස් ගණනකින් කැදලි සංකීර්ණ සාදයි.

ගැහැණු සතුන් තම උපන් වෙරළට නැවත පැමිණීමට තෝරා ගන්නා අතර වැඩි දියුණු කරන ලද රසායනික සංවේදක හරහා වෙරළේ සුවඳ මතක තබා ගැනීමෙන් මෙය සිදු කරයි. බිත්තර සහ පැටවුන් ආරක්ෂා කිරීමට උත්සාහ කරනු ලබයි.

ගැහැණු සතුන් සාමාන්‍යයෙන් ප්‍රජනක ලෙස ක්‍රියාකාරී වීමට පෙර සෙන්ටිමීටර 60 ක දිගකට ළඟා විය යුතු ය. ඔවුන් ඒකලිංගික නොවේ. පිරිමි ශුක්‍රාණු මුළු අභිජනන සමය පුරාම භාවිතය සඳහා ගැහැණු සතා තුළ ගබඩා කර තබා ගනී. සංසර්ගය සිදුවන්නේ අභිජනන වෙරළ තීරයෙන් ඔබ්බට ය. බටු කැස්බෑවා සමූහ කැදලි සඳහා ප්‍රසිද්ධය. වරකට ගැහැණු සතුන් 300ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වෙරළට පැමිණේ. මුහුදේ සිට මීටර් 50ක් පමණ දුරින් පිහිටා ඇති වෙරළ තීරයක සෙන්ටිමීටර 30-55ක් ගැඹුරට කුඩුවක් හාරා බිත්තර 107ක් වැනි ප්‍රමාණයක් තැන්පත් කර පසුව නැවත මුහුදට පැමිණේ. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා ගැහැණු කැස්බෑවන්ට පැයකට වඩා අඩු කාලයක් ගතවේ. ගැහැණු සතුන් පසුකාලීන භාවිතය සඳහා ඔවුන්ගේ ශරීරවල ශුක්‍රාණු ගබඩා කරන බැවින් තනි ගැහැණු සතෙකුට අඛණ්ඩව මාස කිහිපයක් කැදලි තැනිය හැකිය. බිත්තර 34-43mm පමණ වන අතර උෂ්ණත්වය අනුව දින 45-51ක් ඇතුළත පැටවුන් බිහි වේ. උෂ්ණත්වය කැස්බෑවාගේ ලිංගභේදය තීරණය කරයි. පැටවුන් 37.9-49.9mm වේ.

කැස්බෑවන් වැඩි පිරිසකගේ මරණයට ට්‍රෝලර් යාත්‍රා සහ වෙරළබඩ කැණීම් ආදිය හේතු වී ඇත. මොවුන්ගේ බිත්තර බොහෝ විට අයාලේ යන බල්ලන් විසින් ගොදුරු කර ගනු ලැබේ. තවත් සමහර තර්ජන වන්නේ කැස්බෑ බිත්තර දඩයම් කිරීම, වෙරළ තීරයේ ඉදිකිරීම් ආදියයි. සාගර දූෂණය හේතුවෙන් ප්ලාස්ටික් බෑග් සහ සෘජුෆෝම් වැනි අපද්‍රව්‍ය ශරීරගත වීම මඟින් ඔවුන් මරණයට පත්වේ. මෙම කැස්බෑවන් ට්‍රෝලර් යාත්‍රාවල දැල්වලට හසු වී බෝට්ටු පිටුපසින් බොහෝ දුරක් ඇදගෙන යාමෙන් මතුපිටට පැමිණීමට නොහැකිව හුස්ම හිරවී මිය යයි.

### 1.1.2.1.5. දාර කැස්බෑවා (Leatherback Turtle)

මෙම කැස්බෑවන් ශ්‍රී ලංකාවේ ඉඳුරුව, මාවැල්ල, උස්සන්ගොඩ, රැකව, අම්බලන්ගොඩ, කොස්ගොඩ, බුන්දල, ගොඩවාය සහ යාල ඇතුළු ප්‍රදේශවල කැදලි තනනු දක්නට ලැබේ. දාර කැස්බෑ සතුන් බොහෝ විට නිවර්තන ජලයේ දක්නට ලැබුණ ද ඔවුන් ලොව පුරා සෞම්‍ය සාගරවල සහ උප ආක්ටික් සාගරවල පවා දක්නට ලැබේ. ඔවුන් උතුරට ගමන් කර නිව්ෆවුන්ඩ්ලන්තය, නෝවා ස්කොටියා සහ ලැබ්‍රඩෝ වැනි උතුරු අත්ලාන්තික් සාගර ජලයේ ජීවත් වේ. ඔවුන් දකුණු අත්ලාන්තික් ජලයේ ද ආර්ජන්ටිනාව සහ දකුණු අප්‍රිකාව දක්වා වාසය කරනු ලබයි. මෙම කැස්බෑවා බ්‍රිතාන්‍යය සහ නෝර්වේ වැනි නැගෙනහිර ජලයේ ද වාසය කරයි.

දාර කැස්බෑවා ජීවමාන කැස්බෑවන්ගෙන් විශාලතමයා වේ. පිටෙහි දාර මෙන් නෙරුම් කිහිපයක් ඇති නිසා මෙසේ හැඳින්වේ. ඔවුන්ගේ ශරීරය විධිමත් වන අතර විශාල මාංශපේශී ඇත. කවචය සම්, තෙල් සහිත සහ කාටිලේජ සහිත වන අතර කුඩා අස්ථි ගණනාවක ජාලයකින් ශක්තිමත් වේ. නියපොතු හෝ කොරපොතු නොමැත. ඔවුන්ගේ ඇඟි බැම ඝන වන අතර සිරස් විවරයකට ආසන්න වේ. මෙම කැස්බෑවා හට අද්විතීය w−හැඩැති මුඛයක් ඇති අතර එය ග්‍රහණය කර ගැනීම සඳහා හොඳින් අනුවර්තනය වේ.

මෙම කැස්බෑවන් ඉතා සීතල ජලයේ ජීවත් වේ. අනෙකුත් මුහුදු කැස්බෑවන්ට එය දරාගත නොහැක. ඔවුන්ගේ සාමාන්‍ය ආයු කාලය අවුරුදු 30 කි. මෙම සතුන් බොහෝ විට හුදකලා වේ. මොවුන් දියවැල් හරහා විශාල දුරක් මෙන් ම මීටර් 1200 තරම් ගැඹුරට ගමන් කරයි. වැඩුනු කැස්බෑවකු මී.2.5ක් පමණ දිගින් යුක්ත වේ. එක කැදැල්ලක බිත්තර 130ක් පමණ දමයි. දැල්ලන්, ජෙලි ෆිෂ් වැනි සතුන් ආහාරයට ගනී.

ගැහැණු සතා ප්‍රජනක පරිණතභාවයට පත්වන්නේ අවුරුදු 5-12 (සාමාන්‍යයෙන් අවුරුදු 13) තුළ ය. පෙර කන්නයේ දී සාර්ථක වුවහොත් පිරිමි සතුන් එම කැදලි වෙරළටම නැවත පැමිණෙන බව දන්නා කරුණකි. පිරිමි කැස්බෑවන් සාමාන්‍යයෙන් කූඩු කාලය ආරම්භ වීමට පෙර පොදු කූඩු වෙරළට ඔබ්බට සංක්‍රමණය වේ. ඔවුන් හැකි තරම් ගැහැණු සතුන් සමඟ සංසර්ගයේ යෙදීමට උත්සාහ කරති. ඔවුන් ජලයේ සංසර්ගයේ යෙදේ. මෙම ගැහැණු කැස්බෑවුන් දින 55-75 ක ගර්භණී කාලයක් ඇති අතර පසුව ඔවුන් රාත්‍රියේ වෙරළට පිහිනමින් කූඩු කිරීමට ගොඩබිමට පිහිනනු ලබයි.

ඔවුන් බිත්තර දමන්නේ නිවර්තන වෙරළ තීරයේ වැලි වලයි. මෙම කැස්බෑවන් වසරකට කැදලි 5-7ක් පමණ තබන අතර සෑම දින 9-10 කට වරක් නැවත කැදලි සාදයි. එසේම ඔවුන් සෑම වසර 2-3 කට වරක් එකම කැදලි ස්ථානයට නැවත පැමිණේ. ශ්‍රී ලංකාවේ කැදලි තැනීම මැයි සහ ජුනි මාසවල ද ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී ද සිදු වේ. මොවුන්ගේ කැදලි අනෙකුත් සියලුම කැස්බෑවන්ට වඩා ගැඹුරු වන අතර බිත්තර 90-130 කින් සමන්විත වේ. මෙම බිත්තර ගෝලාකාර මෘදු කවචයක් සහිත සහ මි.මී. 50-54 ප්‍රමාණයකින් යුක්ත වේ. සාමාන්‍යයෙන් සුදු නමුත් කොළ පැහැති ලප අඩංගු විය හැකිය. ගැහැණු සතා බිත්තර දැමූ පසු කොල්ලකෑම් වැළැක්වීම සඳහා සහ බිත්තර වටා උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය මධ්‍යස්ථ කිරීම සඳහා කූඩුව වැලිවලින් ආවරණය කරයි. ගැහැණු සතා මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු ඇය සාගරයට නැවත පැමිණෙන අතර පසුව දෙමාපියන්ගේ රැකවරණයක් නොලැබේ.

කූඩුවේ උෂ්ණත්වය පැටවුන්ගේ ලිංගිකත්වය තීරණය කරයි. සෙල්සියස් අංශක 29.5 දී පැටවුන් පිරිමි හෝ ගැහැණු වීමට සමානව ඉඩ ඇති අතර 28.75°C හෝ ඊට අඩු උෂ්ණත්වයකදී පැටවුන් පිරිමි වන අතර 29.75°Cට වැඩි නම් ඔවුන් ගැහැණු වනු ඇත.

කූඩු කරන ගැහැණු සතුන් තම බිත්තර පොකුර මත වැලි අසුරන්නේ සමහර විට බිත්තරවල සුවඳ සැඟවීමට සහ කුඩා විලෝපිකයන්ට ඒවා හාරා ගැනීමට අපහසු කිරීමටයි. කැදලි වල පැටවුන් බිහිවීමේ සාර්ථකත්වය 50% ක් පමණ බාධාවකින් තොරව සිදු වන නමුත් බොහෝ කූඩු විවිධ විලෝපිකයන් විසින් විනාශ කරනු ලැබේ.

පැටවුන් මතුවීමට සහ ජලය දෙසට යාමට රාත්‍රිය උදාවන තෙක් බලා සිටී. මෙම කැස්බෑ වැඩිහිටි සතුන් ශක්තිමත් සහ වේගවත් පිහිනන්නන් වන අතර ඔවුන්ට ආක්‍රමණශීලී ලෙස ආරක්ෂා විය හැකිය. ඔවුන්ගේ ශරීරයේ වැඩි කොටසක් ආවරණය වන අස්ථි තහඩු මත ඇති සම්බන්ධක පටක සන තට්ටුව යම් දුරකට විලෝපිකයන්ගෙන් බේරීමට උපකාරී වේ. ඔවුන් කවචයට හානි කළ හැකි පාෂාණවලින් වැළකී සිටිති.

මිනිසුන් මෙම විශේෂයේ ප්‍රධාන විලෝපිකයා වන අතර බිත්තර එකතු කර වැඩිහිටියන් මරා දමයි. මෙම කැස්බෑවුනගේ මස් ඇතැම් විට මිනිසුන්ට සහ අනෙකුත් සතුන්ට විෂ සහිත වේ. එසේ සිදු වන්නේ ඔවුන් අනුභව කරන ජෙලිෆිෂ් ආහාරයේ කොටසක් ලෙස ශරීරගත වූ විෂ ද්‍රව්‍ය නිසා විය හැකිය. වැඩිහිටි කැස්බෑවුන්ගේ සිරුරු වලින් තෙල් ඖෂධීය භාවිතය සඳහා සහ ජල ආරක්ෂණ කාරකයක් ලෙස නිස්සාරණය කරනු ලැබේ. මෙම විශේෂයට ඇති ප්‍රධාන තර්ජනය වාණිජ මසුන් ඇල්ලීමයි. කැස්බෑවුන් අහම්බෙන් දැල් සහ ට්‍රෝල් යාත්‍රාවලට හසු වී ගිලී යාම නැතහොත් කොකුවලට පැටලීම ආදිය හේතුවෙන් මරණයට පත් වේ. සාගර දූෂණය ද ඔවුන්ගේ මරණයට හේතු වේ. විශේෂයෙන් ඔවුන් දිරවිය නොහැකි ප්ලාස්ටික් බෑග් ආහාරයට ගැනීම හේතුවෙන් මරණයට පත් වීම දැකිය හැකි ය.

මොවුන් සියල්ලන්ම වඳවී යාමේ තර්ජනයට ලක්ව සිටී. 1972 සත්ත්ව හා තුරුලතා ආරක්ෂක පනත හා 1993 නව සංශෝධනයට අනුව කැස්බෑවන් මැරීම, බිත්තර එකතු කිරීම, කටු ලඟ තබා ගැනීම හෝ ප්‍රවාහනය තහනම් කෙරිණි. නීති උල්ලංඝනය කරන්නන්ට රු. 10,000 – 30,000 දක්වා අඩ මුදලක් හෝ වසරක සිර දඬුවමක් හෝ මේ දෙකටම යටත් වීමට සිදු වේ. කෙසේ වුවද කැස්බෑ විනාශය වලක්වා ගැනීමට තවමත් හැකියාවක් ලැබී නොමැත. මිනිස් ක්‍රියාකාරකම්වලට අමතරව කැස්බෑ පැටවු සාගරයේ ප්‍රභල මත්ස්‍යයන්ට ගොදුරු වීම ද, කැස්බෑ ගහනය අඩු වීමට හේතු වේ.

මැයි 25 වනදාට යෙදෙන ජාත්‍යන්තර කැස්බෑ දිනයට පමණක් සීමා නොවී දවස් 365 මුළුල්ලේ ම අවදානයට ලක් කරන්නේ නම් ඉතිරි වී ඇති කැස්බෑවුන් අල්ප ප්‍රමාණය හෝ රැක ගැනීමට අපට හැකිවනු ඇත. ඒ වෙනුවෙන් බිහි වූ ක්‍රමවේදයක් ලෙස ලංකාවේ කැස්බෑවුන් කැදලි තැනීමට පැමිණෙන වෙරළ තීරයන් ඉලක්ක කර ගනිමින් බිහි වී ඇති කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන පෙන්වා දිය හැකි ය. කොස්ගොඩ සිට බළපිටිය දක්වා වෙරළ තීරය ද එලෙස කැස්බෑවුන් කැදලි තැනීමට පැමිණෙන වෙරළ තීරයකි. එම වෙරළ තීරය ආශ්‍රිතව බළපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන හතක් ක්‍රියාත්මක වේ.

### 1.1.2.2. බළපිටිය ප්‍රදේශයේ පිහිටි කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | | කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයේ නම | ලිපිනය | දුරකථන අංකය | වෙබ් පිටුව |
|---|---|---|---|---|---|---|
| 1 | 15 | දූවේමෝදර | මහපැළැන කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානය | ගාලු පර, මහපැළැන, කොස්ගොඩ | 77 6007302 | Kosgodaseaturtle.org |
| 2 | 15 | දූවේමෝදර | දූවේමෝදර කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානය | ගාලු පර, දූවේමෝදර, කොස්ගොඩ | 76 6532811 | Kosgodaturtle.org |
| 3 | 17 ඒ | කොස්ගොඩ | Galbokka Sea Turtle Conservation Research Center | ගල්බොක්ක පාර, කොස්ගොඩ | 77 6138135 | www.galbokkaseaturtles.com |
| 4 | 17 ඒ | කොස්ගොඩ | Victor Hasselblad Sea Turtle Research | පාසල් මාවත, හිද්දරුව, කොස්ගොඩ | 71 7879928 | www.htrcc.info |
| 5 | 17 ඒ | කොස්ගොඩ | Pathum Fernando Sea Turtle Sanctuary & Conservation | ඥණවිමල මාවත, හිද්දරුව,කොස්ගොඩ | 77 6332208 | - |
| 6 | 17 ඒ | කොස්ගොඩ | Sri Lanka Volunteer Turtle Protection Center | වැලිපාර, හිද්දරුව, කොස්ගොඩ | 77 6414237 | - |
| 7 | 19 ඒ | වතුරේගම | අහුන්ගල්ල කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානය | ගාලු පාර, වතුරේගම, අහුන්ගල්ල | 77 2266888 | - |

දත්ත සටහන 19.1

මූලාශ්‍රය: සමාජ ආර්ථික පැතිකඩ, 2025

